# කුඹුරු ගොවිතැන

පුරාණ කාලයේ සිට ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කාර්යය වූයේ කෘෂිකර්මාන්තය යි. එහි ප්‍රධාන කොටස් දෙකක් පැවතියේ ය. ඒ මඩ ගොවිතැන හා ගොඩ ගොවිතරන වශයෙනි(lowland cultivation & highland cultivation). මේ අතරින් වඩාත් ප්‍රධාන වශයෙන් සිදු කෙරුණේ මඩ ගොවිතැන හෙවත් කුඹුරු වගාවයි. වී වගාව යනු ද ඒ මය. වී ගොවිතැන ප්‍රධාන වශයෙන් කෙරෙන්නේ මඩ ගොවිතැනක් වශයෙනි. මේ සඳහා ද යොදා ගත්තේ තැනි බිම් ය. ලංකාවේ කඳුකරයේ ඇති හෙල්මැලි කුඹුරු සකසා ඇත්තේ ද බෑවුම් වල පටු තැනි බිම් සකස් කිරීමෙනි. හ් නිසා තැනි බිම් භාවිතය මෙහි නිත්‍ය ලක්ෂණයක් බැව් පැහැදිලිය.

ශ්‍රී ලංකවේ වැඩි වශයෙන් වී වගා කෙරෙන්නේ අභ්‍යන්තර තැනිතලාව ආශ්‍රිතව ය. ලංකාව වටා ම ඇති වෙරළ තීරය හා මධ්‍යම කඳුකරය අතර ප්‍රදේශයේ මේ තැනිතලා බිම් පැතිර තිබේ.

මේ නිසා කුඹුරු වගා බිම් ආශ්‍රිතව වැඩි වශයෙන් දැකිය හැක්කේ තැනි බිම් ය.

වී වගාවේ ද ප්‍රධාන අවස්ථා ගණනාවක් ඇත නියර සකස් කිරීම, මූලික පස් පෙරළීම, ද්විතීයික බිම් සැකසීම, මඩ සැකසීම, වී වැපිරීම, පොහොර ඉසීම, අස්වනු

නෙළීම, අස්වනු සකස් කිරීම, වියළීම, ගබඩා කිරීම ආදී වශයෙනි. මේ අතරින් අවසන් අවස්ථා දෙක හැර අන් සියල්ල සිදු වන්නේත් කුඹුර අශ්‍රිතවම ය. මේ නිසා මේ පිළිබඳ සිත්තම් කිරීමේ දී මේ පුළුල් තේමා පරාසය තුළ ඔබ කැමති මාතෘකාවක් සකසා ගන්නට ඔබට නිදහස තිබේ.

කුඹුරු ගොවිතැන අශ්‍රිතෙව දැන් දැන් මිනිස් ශ්‍රමය අඩු වුව ද මිනිසුන්ගේ විවිධ ක්‍රියාකාරකම්, හැසිරීම් රටා මේ ආශ්‍රිතව දැකිය හැක. මේ පිළිබඳ ප්‍රයෝගික අවබෝධය ඇත්නම් වඩාත් හොඳ ය. මේ අවස්ථාවල භාවිත කරන උපරකරණ හා ඒවා භාවිත කරන ආකාරය පිළිබඳවත් කෙත ආශ්‍රිත සිරිත් විරිත් පිළිබඳවත් යම් අවබෝධයක් ඇතිනම් ඔබට සෙසු අයට වඩා වෙනස් නව නිර්මාණයක් කරන්නට හැකි වනු ඇත. මේ අවස්ථාවේ අඳින ඇඳුම්, හැසිරීම් රටා, ආදිය පමණක් නොව ගොවිතැනට දියවර(ජලය) සපයා ගන්නා ආකාරය, කාන්තා හා පුරුෂ පාර්ශ්වයන් ඊට දායක වන ආකාරය ආදිය ද අධ්‍යයනය කරන්න.

කුඹුරක් යනු පර්යාවලෝකන ලක්ෂණ පහසුවෙන් දැකගතහැකි ස්ථානයකි. මේ නිසා එය නිවැරදිව දැක්වීම කෙරෙහි ද ඊට අනුරූපව මානව රූප හා සෙසු වස්තූන් යොදා ගන්නා ආකාරය පිළිබඳව ද විමසිලිමත් වන්න. වර්ණ ශක්ති හා වර්ණ පර්යාවලෝකණය කෙරෙහි ද අවධානය යොමු කරන්න.

සිතුවම නිම කිරීමට යොදා ගන්නා වර්ණ මාධ්‍යය, ශිල්පීය ක්‍රමය ආදිය තුළින් ද ඔබට යම් වෙනසක් කළ හැක. මේ ආදී දේ පිළිබඳ සිතන්න. එහෙත් සිතුවමට පිවිසෙන්න සැහැල්ලු සිතින්.